## උතුරු නැගෙනහිර ජල සම්පාදන, සනීපාරක්ෂක හා සෞඛ්‍ය (ඩබ්ලිව්ජ්එස්එච්) ව්‍යාපෘතිය - 2013

උතුරු නැගෙනහිර ජල සම්පාදන, සනීපාරක්ෂක හා සෞඛ්‍ය (ඩබ්ලිව්ජ්එස්එච්) නියමු ව්‍යාපෘතියේ 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය (ශ්‍රීලංර) හා ලෝක බැංකුව අතර 2011 නොවැම්බර් 29 දින එළඹි අංක ටීඑෆ් 010773 දරන ප්‍රදාන ගිවිසුමේ 2.06 (ඇ) වගන්තිය සමග සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි.

### 1.2 ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම, අරමුණු, අරමුදල් යෙදවීම හා ව්‍යාපෘති කාලය

උතුරු නැගෙනහිර ජල සම්පාදන, සනීපාරක්ෂක හා සෞඛ්‍ය (ඩබ්ලිව්ජ්එස්එච්) ව්‍යාපෘතියේ ප්‍රදාන ගිවිසුම අනුව, ජල සම්පාදන හා ජලාපවහන අමාත්‍යාංශය යටතේ ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය (ජාජසජම) ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායතනය වේ. ව්‍යාපෘතියේ අරමුණු වන්නේ උතුරු සහ නැගෙනහිර පළාත්වල දිස්ත්‍රික්ක 2 ක් තුළ තෝරාගත් ග්‍රාමීය ප්‍රජාවක අනුපූරක පසු ගැටුම් නිවාස ප්‍රතිසංස්කරණ මැදිහත්වීම් සඳහා ආරක්ෂිත හා තිරසාර නල ජල සැපයුම් සඳහා ප්‍රවේශය වැඩිදියුණු කිරීමටත් දේශීය මට්ටමේ ජලය සහ සනීපාරක්ෂක සෞඛ්‍ය සේවා බෙදාහැරීම සඳහා ආයතනික පද්ධතීන් ශක්තිමත් කිරීමට හා සෞඛ්‍ය පුරුදුවල සමස්ත වර්ධනයක් හා ආපසු පැමිණෙන්නන් සඳහා සමස්ත ජීවන තත්ත්වයන් වර්ධනය කිරීමට හා අවසානයේ උපදෙස් හා අනුකරණීය හැඩගැස්මක් ලබාදීමට දායකවීම සඳහා සාධ්‍ය යාන්ත්‍රණයක් නියාමනය කිරීමටය. ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත මුළු පිරිවැය රු.මිලියන 297.28 කට සමාන එජඩො මිලියන 2.49 ක් වූ අතර එයින් රු.මිලියන 257.28 කට සමාන එජඩො මිලියන 2.01 ක් එනම් සියයට 80.23 ක් මූල්‍යයනය කිරීමට ලෝක බැංකුව එකඟවී තිබුණි. 2011 නොවැම්බර් 16 දින ව්‍යාපෘතිය එහි කටයුතු ආරම්භ කරන ලද අතර 2014 ජූනි 30 වන විට නිම කිරීමට නියමිත විය.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

මෙම මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම කළමනාකරණයේ වගකීම වේ. වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන අභ්‍යන්තර පාලනයන් සැලසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම සහ පවත්වා ගෙනයාමත්, යෝග්‍ය ගිණුම්කරණ ප්‍රතිපත්ති තෝරා ගැනීම සහ යොදා ගැනීමත් අවස්ථාවෝචිතව සාධාරණ ලෙස ගිණුම්කරණ ඇස්තමේන්තු සකස් කිරීමත් මෙම වගකීමට ඇතුළත් වේ.

## 2. විගණන විෂය පථය හා මතය සඳහා පදනම

මාගේ විගණන පරීක්ෂණ මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මෙම වාර්තාවේ ඇතුළත් විගණන මතය, අදහස් දැක්වීම් සහ සොයා ගැනීම්, විගණනය සඳහා ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන පිළිබඳ සමාලෝචනය සහ ගනුදෙනුවල නියැදි පිළිබඳ තහවුරු පරීක්ෂා කිරීම් මත පදනම් වී ඇත. එම සමාලෝචනය සහ පරීක්ෂණයන්ගේ විෂය පථය සහ ප්‍රමාණය, මට ලැබී ඇති කාර්ය මණ්ඩලය, අනෙකුත් සම්පත් සහ කාලවේලා යන සීමාවන් ඇතුළත හැකිතාක් පුළුල් විගණනයක් කළ හැකි වන පරිදි පිළියෙල කරන ලද්දකි. මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව විගණනය සිදුකරන ලදි. මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට උපකාරීවන සාක්ෂි නියැදි පදනම මත පරීක්ෂා කිරීම් , මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්ති හා වැදගත් ඇස්තමේන්තු සහ මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුළත් වේ. මාගේ උපරිම දැනීම සහ විශ්වාසය පරිදි විගණන කටයුතු සඳහා අවශ්‍යවන ප්‍රමාණවත් තොරතුරු සහ පැහැදිලි කිරීම් මා විසින් ලබා ගන්නා ලදි. ඒ අනුව මාගේ මතය සඳහා

ප්‍රමාණවත් පදනමක් මාගේ විගණනය මඟින් සපයන බව මාගේ විශ්වාසයයි. පහත සඳහන් දෑ තක්සේරු කිරීමෙහිලා අවශ්‍ය යැයි සලකනු ලැබූ පද්ධති හා පාලන, ගනුදෙනු, වත්කම්, වගකීම් හා ගිණුම් වාර්තා පිළිබඳ එවැනි පරීක්ෂා කිරීම්ද එම පරීක්ෂණයට ඇතුළත් විය.

(අ) අභ්‍යන්තර පාලන අංශයෙන් බලන කල ව්‍යාපෘති කළමනාකරණය පිළිබඳ සතුටුදායක පාලනයක් සහ ව්‍යාපෘතියේ මෙහෙයුම්වලට අදාළ පොත් පත්, වාර්තා ආදියේ විශ්වාසවන්තභාවය තහවුරු වනු පිණිස පද්ධති සහ පාලන ප්‍රමාණවත් වූයේද යන බව.

(ආ) ශ්‍රී ලංකා රජයෙන් සහ ආධාර සපයනු ලබන නියෝජිතායතනයෙන් ලද අරමුදල්වලින් දරන ලද ව්‍යාපෘති වියදම්, මූල්‍ය හා භෞතික වශයෙන් ව්‍යාපෘතියේ ප්‍රගතිය, ව්‍යාපෘතියේ මෙහෙයුම් කටයුතුවලින් උද්ගත වූ වත්කම් සහ වගකීම්, ප්‍රදාන යටතේ මිලදී ගැනීම් හඳුනා ගැනීම ආදිය දැක්වෙන පරිදි අඛණ්ඩ පදනමක් මත ප්‍රමාණවත් ගිණුම් වාර්තා පවත්වා ගනු ලැබුවේද යන බව.

(ඇ) ප්‍රදාන යටතේ ආපසු ගැනීම් ප්‍රදාන ගිවිසුමේ දක්වා ඇති පිරිවිතරයන්ට අනුකූලව සිදුකර තිබුණේද යන බව.

(ඈ) ප්‍රදාන යටතේ සපයන ලද අරමුදල්, ද්‍රව්‍ය සහ උපකරණ ව්‍යාපෘතියේ අරමුණු සඳහා උපයෝජනය කර තිබුණේද යන බව.

(ඉ) ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා යොදා ගන්නා ලද වර්ගීකරණයට අනුව වියදම් නිවැරදිව හඳුනාගෙන තිබුණේද යන බව.

(ඊ) පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්ම පදනම් කර ගෙන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර තිබුණේද යන බව.

(උ) විශේෂ ඩොලර් ගිණුමේ ආරම්භක හා අවසාන ශේෂ, එම ගිණුමෙන් ආපසු ගැනීම් හා එම ගිණුමට ඌනපූර්ණය කිරීම් ව්‍යාපෘතිය විසින් පවත්වා ගනු ලැබූ පොත් පත් හා වාර්තාවල සත්‍ය හා සාධාරණ ලෙස හෙළිදරව් කර තිබුණේද යන බව සහ 2013 දෙසැම්බර් 31 දිනට ශේෂය එදිනට ශ්‍රී ලංකා මහ බැංකුවේ ( ශ්‍රීලංමබැ) ගිණුම් වාර්තා සමඟ සතුටුදායක ලෙස සසඳා තිබුණේද යන බව සහ

(ඌ) ප්‍රදාන ගිවිසුමේ දක්වා ඇති මූල්‍ය සම්මුතීන්වලට අනුකූල වූයේද යන බව.

**3. මතය**

--------

මාගේ පරීක්ෂණයෙන් පෙනී යන අන්දමට සහ මට සපයන ලද උපරිම තොරතුරු සහ පැහැදිලි කිරීම් අනුව, මෙම වාර්තාවේ 5 ඡේදයේ දැක්වෙන කරුණුවලින් උද්ගත වන ගැලපීම්වලින් ඇති වන බලපෑම් හැර, මාගේ මතය වනුයේ,

(අ) 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ව්‍යාපෘතිය නිසි ගිණුම් වාර්තා පවත්වා ඇති බව, 2013 දෙසැම්බර් 31 දිනට ව්‍යාපෘතියේ ක්‍රියාකාරිත්වය පිළිබඳ තත්ත්වය සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව,

(ආ) සපයන ලද අරමුදල් ඒවා සපයනු ලැබූ අරමුණු සඳහා උපයෝජනය කර තිබුණු බව,

(ඇ) ප්‍රදාන ගිවිසුමේ නියම කර ඇති අවශ්‍යතාවයන්ට අනුකූලව ප්‍රතිපූර්ණයන් සඳහා වූ ඉල්ලුම්පත් සනාථ කිරීම සඳහා ඉදිරිපත් කරන ලද වියදම් ප්‍රකාශ (විප්‍ර) කෙරෙහි සාධාරණ ලෙස විශ්වාසය තැබිය හැකි බව, සහ

(ඈ) ප්‍රදාන ගිවිසුමේ දක්වා ඇති මූල්‍ය සම්මුතීන්වලට අනුකූල වූ බවත්ය.

## 4. මූල්‍ය ප්‍රකාශන

-----------------

### 4.1 මූල්‍ය කාර්යසාධනය

------------------------

මූල්‍ය ප්‍රකාශන හා ලබාගත හැකි වූ තොරතුරු අනුව, 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ව්‍යාපෘති වියදම රු.161,834,615 ක් වූ අතර 2013 දෙසැම්බර් 31 දිනට සමුච්චිත වියදම රු.210,307,217 ක් විය. සමාලෝචිත වර්ෂය සඳහා වියදම, ඉකුත් වර්ෂය සඳහා වියදම සහ 2013 දෙසැම්බර් 31 දිනට සමුච්චිත වියදම පිළිබඳ සාරාංශයක් පහත දැක්වේ.

| **විෂයය** | **2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වියදම** | | **2013 දෙසැම්බර් 31 දිනට සමුච්චිත වියදම** |
|---|---|---|---|
| | 2013 | 2012 | |
| | රු. | රු. | රු. |
| ලී බඩු , උපකරණ හා සවිකිරීම් | 9,500 | 5,260,186 | 5,269,686 |
| කෙරීගෙන යන වැඩ | 161,825,115 | 43,212,416 | 205,037,531 |
| | 161,834,615 | 48,472,602 | 210,307,217 |

### 4.2 විශේෂ ඩොලර් ගිණුම

--------------------------

මූල්‍ය ප්‍රකාශන හා ලබාගත හැකිවූ තොරතුරු අනුව, 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ශ්‍රී ලංකා මහ බැංකුව විසින් පවත්වා ගෙන යනු ලබන විශේෂ ඩොලර් ගිණුමේ මෙහෙයුම් පහත දැක්වේ.

| | **එ.ජ.ඩො.** | **රු.** |
|---|---|---|
| 2013 ජනවාරි 1 දිනට ශේෂය | 895,425 | 113,863,080 |
| එකතුකළා :- ඌනපූරණයන් | 471,672 | 61,532,882 |
| විදේශ විනිමය වාසිය | - | 2,006,987 |
| | 1,367,097 | 177,402,949 |
| අඩුකළා :- ආපසු ගැනීම් | 1,073,727 | 139,043,878 |
| 2013 දෙසැම්බර් 31 දිනට ශේෂය | 293,370 | 38,359,071 |

## 5. විගණන නිරීක්ෂණ

## 5.1 ගිණුම්කරණ අඩුපාඩු

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 2013 දෙසැම්බර් 31 දිනට ගෙවිය යුතු රු.1,369,193 ක මුදලක් ගිණුම්ගත කර නොතිබුණි.

(ආ) 2013 දෙසැම්බර් 31 දිනට විශේෂ (ඩොලර්) ගිණුමේ පැවති රු.38,359,071 ක් වූ ශේෂය මූල්‍ය ප්‍රකාශනවල ලෝක බැංකු අරමුදල් (ප්‍රදාන ) ගිණුමේ උපයෝජනය කළ අරමුදල් ලෙස සලකා තිබුණි.

## 5.2 නීති,රීති හා රෙගුලාසි වලට අනුකූල නොවීම

පහත සඳහන් අනුකූල නොවීම් අවස්ථා නිරීක්ෂණය විය.

(අ) ප්‍රදාන ගිවිසුමේ 2.06 වගන්තිය අනුව, එක් එක් ගිණුම් කාලපරිච්ඡේදය සඳහා විගණිත මූල්‍ය ප්‍රකාශන එක් එක් මූල්‍ය වර්ෂය අවසන් වී මාස 6 ක් ඇතුළත ලෝක බැංකුවට ඉදිරිපත් කළ යුතුය. කෙසේ වුවද 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශන විගණනයට ඉදිරිපත් කර තිබුණේ 2014 ජූලි 21 දිනදීය.

(ආ) මුදල් රෙගුලාසි 134(3) හා 2010 ජූලි 20 දිනැති අංක 05 දරන කළමනාකරණ විගණන චක්‍රලේඛය අනුව, ව්‍යාපෘතියේ කාර්යයන් ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයේ අභ්‍යන්තර විගණන අංශය විසින් විගණනය කර නොතිබුණි.

## 6. මූල්‍ය හා භෞතික කාර්යසාධනය

## 6.1 අරමුදල් උපයෝජනය

මූල්‍යයනය, අයවැයගත ප්‍රතිපාදනය හා 2013 දෙසැම්බර් 31 දිනට අරමුදල් උපයෝජනයට අදාළ වැදගත් සංඛ්‍යා ලේඛන කිහිපයක් පහත දැක්වේ.

| ප්‍රභවය | සැපයීම සඳහා එකඟවූ මුදල | | 2013 වර්ෂය සඳහා අයවැයගත ප්‍රතිපාදනය | සමාලෝචිත වර්ෂය සඳහා උපයෝජනය කළ අරමුදල් | 2013 දෙසැම්බර් 31 දින දක්වා දරන ලද මුළු වියදම |
|---|---|---|---|---|---|
| | එ.ජ.ඩො. මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන |
| ලෝක බැංකුව | 2.01 | 257.28 | 175 | 144.15 | 180.62 |
| ශ්‍රී ලංකා රජය | 0.48 | 40.00 | 25 | 17.68 | 29.68 |
| එකතුව | 2.49 | 297.28 | 200 | 161.83 | 210.30 |

## 6.2 භෞතික කාර්යසාධනය

---

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) කාර්තුමය ආකාරයෙන් මූල්‍ය හා භෞතික ඉලක්ක දක්වමින් සමස්ත ව්‍යාපෘති කාල පරිච්ඡේදය ආවරණය වන පරිදි විස්තරාත්මක ක්‍රියාකාරී සැලැස්මක් පිළියෙල කර තිබුණද, එම ක්‍රියාකාරී සැලැස්මට අනුකූලව ව්‍යාපෘති කාර්ය සාධනය තහවුරු කර ගැනීමට ඉහත ක්‍රියාකාරී සැලැස්ම පදනම් කරගත් ප්‍රගති වාර්තා හෝ වෙනත් යාන්ත්‍රණයක් හඳුන්වාදී නොතිබුණි.

(ආ) මතකිරාමම් ජල සම්පාදන යෝජනා ක්‍රමය සඳහා හැරු ළිං 02 ක් ඉදිකිරීමේදී වර්ග මීටර් 208.15 ක් වූ කළු ගලක් ඉවත් කිරීමට විචලන නියෝගයකින් අනුමැතිය ලබාදී තිබූ අතර, රු. 1,912,876 ක මුදලක් ඒ සඳහා කොන්ත්‍රාත්කරුට ගෙවා තිබුණි. ලැබුණු තොරතුරු අනුව, කළු ගල් ද්‍රව්‍ය වැඩ බිමේ ගොඩ ගසා තිබූ අතර, එම කළු ගල් ද්‍රව්‍ය ජල සම්පාදන උපයෝගිතා සංවිධානවල කාර්යයන් සඳහා භාවිතා කිරීමට ඉඩදී තිබුණි.

**(ඇ)** ලැබුණු තොරතුරු අනුව, ව්‍යාපෘතිය විසින් ක්‍රියාත්මක කරන ලද සනීපාරක්ෂක වැඩිදියුණු කිරීමේ වැඩ සටහන යටතේ ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කයේ නිවැසියන් 388 ක් සඳහා වැසිකිළි පහසුකම් වැඩිදියුණු කිරීමට අපේක්ෂා කර තිබුණි. කෙසේ වුවද 2013 දෙසැම්බර් 31 දිනට නිවැසියන් 298 ක් සඳහා වැසිකිළි පහසුකම් ලබාදී තිබුණි.

(ඈ) ව්‍යාපෘතියේ ප්‍රගති වාර්තාවට අනුව, ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කයේ ගම් 4 ක පවුල් 1,121 ක් සඳහා ජල මණු සහිතව ජල සම්බන්ධනයන් සැපයීමට අපේක්ෂා කර තිබුණි. 2013 දෙසැම්බර් 31 දිනට නල ජල සම්බන්ධනයන් සැපයීමේ ප්‍රගතිය පහත පරිදි වේ.

| | ඉලක්කගත පවුල් සංඛ්‍යාව | | |
|---|---|---|---|
| තෝරාගත් ගම් | ආරම්භක | සංශෝධිත | 2013 දෙසැම්බර් 31 දිනට ලබාදී තිබූ ජල සම්බන්ධන සංඛ්‍යාව |
| නාමල් වත්ත | 232 | 104 | 50 |
| නවට්චිලි | 330 | 280 | 280 |
| මහ දිවුල් වැව | 350 | 350 | 350 |
| කිලිවෙඩ්ඩි | 209 | 150 | 150 |
| එකතුව | 1,121 | 884 | 830 |